**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "ඒ" අර්ථසාධක අරමුදල - 2014**

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "ඒ" අර්ථසාධක අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙන් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1979 ජුනි 01 දිනැති අංක 38/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ I කොටස : (I) වගන්තිය සාමාන්‍ය; 9 ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**1.3 විගණකගේ වගකීම**

**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.**

**මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ**

**වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.**

**මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

## 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වා ගණනය කළ මතය

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ - "ඒ" අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.**

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 හි සඳහන් ආකෘතියේ දක්වා ඇති පරිදි අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.**

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.**

**(අ) රු.265,253 ක් වූ අසාමාන්‍ය හර ශේෂයක් ගැලපීම් කිරීමෙන් තොරව ශේෂ පත්‍ර දිනයට ගෙවිය යුතු බදු ගිණුමේ දක්වා තිබුණි.**

**(ආ) අර්ථ සාධක අරමුදල් "ඒ" සහ"බී" මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කේවල අරමුදල් ශේෂයන් හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී ශේෂයන් අතර රු.1,795,888 ක වෙනසක් නිරීක්ෂණය විය.**

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදලට සමුච්චිත වාර්ෂික බැංකු දායකය රු.14,211,675 ක් වූ අතර එය අරමුදලට නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ ගණනාවක් ලැබිය යුතු මුදල් ලෙස දක්වා තිබුණි.**

**(ආ) ශේෂය නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව රු.18,268 ක මුදලක් 2004 වර්ෂයේ සිට අවිනිශ්චිත ගිණුමේ ( හිටපු සාමාජිකයන්) දක්වා තිබුණි.**

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.3,722,538 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,663,546 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,941,008 කින් හෙවත් සියයට 34.27 කින් අඩුවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂය තුළ සාමාජිකයන්ගේ විශ්‍රාමයාම වැඩිවීම මෙම සෘණාත්මක ප්‍රවණතාවයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.**

## 3.2 මෙහෙයුම් ප්‍රතිඵල

### 3.2.1 මූල්‍ය සමාලෝචනය

ලබාගත හැකිවූ තොරතුරු අනුව, පසුගිය වර්ෂ 03 හා සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවයන් | 2014<br>රු. | 2013<br>රු. | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු, සාමාජිකයන්ට ණය සහ ඉතිරි කිරීමේ ගිණුම් මත පොලී ආදායම | 1,254,998 | 1,013,264 | 844,336 | 1,250,822 |
| බැංකුවේ අතිරේක දායකය | 2,841,401 | 5,222,951 | 6,065,056 | 5,271,604 |
| මුළු ආදායම | 4,096,399 | 6,236,215 | 6,909,392 | 6,522,426 |
| වියදම | 373,861 | 572,669 | 518,657 | 599,455 |
| වර්ෂය සඳහා අතිරික්තය | 3,722,538 | 5,663,546 | 6,390,735 | 5,922,971 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 සිට 2012 කාලපරිච්ඡේදය තුළ ස්ථාවර තැන්පතු, සාමාජිකයන්ට ණය සහ ඉතිරි කිරීම් ගිණුම් මත පොලී ආදායම රු.1,250,822 සිට රු.844,336 දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී පොලී ආදායම රු.1,013,264 සිට රු.1,254,998 ක් දක්වා හෙවත් සියයට 23.85 කින් වැඩිවී තිබුණි.

(ආ) 2010 සිට 2012 කාල පරිච්ඡේදය තුළ අතිරේක දායකය රු.5,271,604 සිට රු.6,065,056 ක් දක්වා සියයට 15 කින් වැඩිවී තිබුණි. එය 2012 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ රු.6,065,056 සිට රු.2,841,401 දක්වා සියයට 53.15 කින් අඩුවී තිබුණි.

(ඇ) අරමුදලේ වියදම 2011 වර්ෂයේ රු.599,455 සිට 2012 වර්ෂයේ රු.518,657 දක්වා සියයට 13.47 කින් අඩු වී තිබුණි. තවද 2013 වර්ෂයේ රු.572,669 සිට සමාලෝචිත වර්ෂයේ රු.373,861 ක් දක්වා වියදම සියයට 34.71 කින් අඩුවී තිබුණි.

**3.3 සාමාජික දායකය**

**විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අරමුදලට ලැබුණු දායකය හා අරමුදලට ලැබුණු පොලිය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.**

| | 2014 | | | | 2013 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික දායකය | බැංකුවේ දායකය | බැර කරන ලද පොලී | එකතුව | සාමාජික දායකය | බැංකුවේ දායකය | බැර කරන ලද පොලී | එකතුව |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 5,791,025 | 8,683,958 | 29,672,141 | 44,147,124 | 6,608,425 | 9,909,385 | 33,583,116 | 50,100,926 |
| එකතු කළා | | | | | | | | |
| වර්ෂය තුළ ලද දායකය හා විවිධ ණයගැතියන් | 500,841 | 751,262 | 3,722,539 | 4,974,642 | 740,960 | 1,111,441 | 5,663,546 | 7,515,947 |
| එකතුව | 6,291,866 | 9,435,220 | 33,394,680 | 49,121,766 | 7,349,385 | 11,020,826 | 39,246,662 | 57,616,873 |
| අඩුකළා | | | | | | | | |
| වර්ෂය තුළ ගෙවීම් | 2,555,273 | 3,831,740 | 12,047,266 | 18,434,279 | 1,558,360 | 2,336,868 | 9,574,521 | 13,469,749 |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | 3,736,593 | 5,603,480 | 21,347,414 | 30,687,487 | 5,791,025 | 8,683,958 | 29,672,141 | 44,147,124 |

**2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ අරමුදලට සාමාජිකයන්ගේ දායකය රු.240,119 කින් හෙවත්සියයට 32.40 කින් අඩුවී තිබුණු අතර, බැංකු දායකයද රු.360,179 කින් හෙවත් සියයට 32.40 කින් අඩුවී තිබුණි. 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී සාමාජිකයන්ට මුළු ගෙවීම් රු.4,964,530 කින් හෙවත් සියයට 36.85 කින් වැඩිවී තිබුණි.**

**3.4 සාමාජිකයන්ට ලබාදුන් ණය**

**(අ) ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සාමාජිකයන්ට දෙන ලද ණය පිළිබඳ විස්තර පහත දැක්වේ.**

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | **2014** | **2013** |
| | රු. | රු. |
| **ජනවාරි 01 දිනට ශේෂය** | **4,610,885** | **4,895,657** |
| **එකතු කළා** | | |
| **වර්ෂය තුළ සාමාජිකයන්ට ගෙවන ලද ණය** | **145,000** | **1,950,000** |
| **සාමාජිකයින්ට ආපසු ගෙවීම්** | **4,755,885** | **6,845,657** |
| **අඩුකළා** | | |
| **වර්ෂය තුළ අයකර ගැනීම්** | **(2,365,606)** | **(2,234,772)** |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,390,279** | **4,610,885** |

**ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සාමාජිකයන්ට ලබාදෙන ලද ණය රු.1,805,000 කින් හෙවත් සියයට 92.56 කින් අඩුවී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අයකර කර ගැනීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.130,834 කින් හෙවත් සියයට 5.85 කින් වැඩිවී තිබුණි.**

**(ආ) රු..2,145,000 ක් වූ පහත සඳහන් ණය මුදල් ණය ගැණුම්කරුවන්ගේ /සාමාජිකයන්ගේ විශ්‍රාම යන දිනය සැලකීමෙන් තොරව සාමාජිකයන්ට ලබාදී තිබුණි.**

| සේවක අංකය | ණය ලබාදුන් දිනය | ණය මුදල | ඉතිරි සේවා කාලපරිච්ඡේදය | ණය නිරවුල් කිරීමේ කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | | රු. | | |
| **98** | **2015 ජනවාරි 01** | **2,000,000** | **අවු. 01 මාස 01** | **වර්ෂ 10** |
| **88** | **2014 ජූලි 04** | **85,000** | **මාස 08** | **වර්ෂ 10** |
| **88** | **2014 අප්‍රේල් 08** | **60,000** | **මාස 11** | **වර්ෂ 10** |
| | | **2,145,000** | | |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

**2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 20 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.**

**4.2** **අරමුදල පිහිටුවීම, අධිකාරි බලය සහ කළමනාකරණය**

**1975 අංක 13 දරන ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 85(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ - "ඒ" අර්ථසාධක අරමුදල පිහිටුවන ලදි. 1975 අංක 13 දරන ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 85(2) වගන්තියේ විධිවිධාන යටතේ මාසික හෝ දෛනික වැටුප් ලබන ලංකා රාජ්‍ය උකස් බැංකුවේ සියළුම සේවකයන් ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සේවකයන් ලෙස සලකනු ලැබ ඔවුන් ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ රැකියාව භාර ගන්නා අතර බැංකුව විසින් ඔවුන් රැකියාවේ යෙදවීමේ කොන්දේසියක් ලෙස අර්ථ සාධක අරමුදලේ "ඒ" සාමාජිකයන් බවට පත්වේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සේවාදායකයා නියෝජනයවීම සඳහා නම් කරනු ලබන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සහ සේවකයින් නියෝජනය වීම සඳහා අරමුදලේ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් මඟින් අරමුදල පාලනය, කළමනාකරණය හා පරිපාලනය කෙරේ.**